# කොටස් හිමි සාමාජිකයා මියගිය අවස්ථාවකදී කොටස් මුදල් ආපසු ගෙවා කොටස් ආපසු පවරා ගැනීම

**01. <u>අවසන් කැමති පත්‍රයක් ඇති අවස්ථාවක</u>**

අවසන් කැමති පත්‍රයේ දක්වා ඇති පරිදි

**02. අන්තිම කැමති පත්‍රයක් නොමැති අවස්ථාවකදී**

**A). මියගිය කොටස් හිමියා විවාහකයකු නම්,** පහත දක්වන 02, 02 (a), 02 (b), 02 (c ) සහ 02 (d) යන ආකාරවලින් එක් ආකාරයකට කොටස් ආපසු පැවරීම වෙනුවෙන් ආදාල මුදල ලබා ගත හැක.

**(02)**1. මියගිය කොටස් හිමියාගේ කලත්‍රයා සහ දරුවන්ගේ එකඟතාව මත නම් කරනු ලබන එක් අයෙකුට හිමිකම ලබාදීම හෝ

2. මියගිය කොටස් හිමියාගේ කොටස් වටිනාකම රු. 5000 නොඉක්මවූ අවස්ථාවල කලත්‍රයා විසින් කොටස් හිමිකම වෙනුවෙන් කරන ලබන ඉල්ලීම් සඳහා පූර්ණ හිමිකම ලබාදීම

**02 a).මියගිය කොටස් හිමියාගේ කොටස් වටිනාකම රු. 5000 ඉක්මවන අවස්ථාවල**

1. කලත්‍රයා ජීවත්ව සිටීනම් කාලත්‍රයා හට 50% ක හිමිකම ලබාදීම
2. ඉතිරි 50% ජීවත්ව සිටින දරුවන් සියළු දෙනාට සමසේ ලබාදීම

**02 b). දරුවන් නොසිටී නම්,**

1. මුළු කොටස් හිමිකම කලත්‍රයා වෙත ලබාදීම

**02 c). කලත්‍රයා මියගිය අවස්ථාවකදී**

1. මුළු කොටස් හිමිකම ජීවත්ව සිටින සිටින සියළු දරුවන් වෙත සමසේ ලබාදීම.

**02(d) කොටස් හිමිකරුගේ කලත්‍රයා හා දරුවන් ජීවතුන් අතර නොමැති අවස්ථාවක**

1. කොටස් හිමියාගේ මව හෝ පියා ජීවත්ව සිටී නම් ඔවුන් දෙදෙනා අතර, සමසේ කොටස් හිමිකම ලබාදීම.
2. එක් අයෙකු ජීවත්ව සිටීනම් 100% කොටස් හිමිකම ඔහු වෙත ලබාදීම.
3. දෙමාපියන් ජීවතුන් අතර නොමැති අවස්ථාවක සහෝදරයන් අතර කොටස් හිමිකම සමසේ ලබාදීම

**B).** කොටස් හිමියා අවිවාහක අයකු නම් - ඉහත 02(d) හි දක්වා ඇති ආකාරයට කොටස් නිකුත් කරනු ලැබේ.

<u>සටහන</u>

01. කොටස් හිමියා නීතියෙන් දික්කසාද වූ අයෙකු වන අවස්ථාවක ඉහත 2.1, 02(c ) 1, 02(d) 1, 02(d) 2, 02(d) 3 යන කරුණු අවස්ථානුකූලව අදාල වනු ඇත.

02. මෙම කොටස් නිකුතු ඉල්ලීම් සම්බන්ධව ගැටළුවක් ඇති වූ විට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ලේකම් විසින් විමර්ශනයක් පවත්වා ලබාදෙනු ලබන තීරණය අවසානාත්මකය.

## ඉල්ලීම් සමඟ ඉදිරිපත් කළයුතු ලේඛන

01. අදාල මුදල් බැර කළයුතු බැංකු ගිණුම්වල, බැංකු පොතේ ගිණුම් අංකය සඳහන් පිටුවේ බැංකුව විසින් සහතික කරන ලද පිටපතක්
02. අංක TSF/01 ආකෘති හා TSF/02 ආකෘතිය සමඟ එහි දක්වා ඇති ලේඛන සහතික කර දිවුරුම් ප්‍රකාශයකින් ඉදිරිපත් කළයුතුය.
    1. කොටස් සහතිකයේ මුල් පිටපත
    2. කොටස් හිමියාගේ මරණ සහතිකය
    3. කොටස් ඉල්ලුම්කරන අය හට එම ඉල්ලීම සිදු කිරීමට ඇති අයිතිය තහවුරු කර ලේඛන අවශ්‍යතාවය අනුව පහත ලේඛන ඉදිරිපත් කළයුතුය
        - මියගිය කොටස් හිමියාගේ අවසන් කැමති පත්‍රයේ සහතික කරන ලද පිටපතක්
        - කොටස් හිමියාගේ විවාහක සහතිකය (විවාහක අයකු නම්)
        - කොටස් හිමියාගේ දරුවන්ගේ උප්පැන්න සහතිකය (විවාහක දරුවන් ඇති අයකු)
        - මියගිය කොටස් හිමියාගේ උප්පැන්න සහතිකය
        - ඉල්ලුම් කරන අයගේ ජාතික හැඳුනුම්පතේ සහතික කරන ලද පිටපතක්
        - මියගිය කොටස් හිමියාගේ සහෝදර/සහෝදරියන් ඉල්ලීම කරන විට ඔවුන්ගේ උප්පැන්න සහතිකවල සනාථ කළ පිටපත ද, ජාතික හැඳුනුම්පතේ සහතික කරන ලද පිටපතක් සහ ග්‍රාම නිලධාරී සහතිකයක් ද ඉදිරිපත් කළ යුතුය.
        - මියගිය සාමාජිකයාගේ කලත්‍රයාගේ දරුවන්ගේ එකතඟතාවය මත එක් අයකුට අදාල කොටස් හිමිකම ලබාදීමේදී එසේ එකඟතාවය දැක්වීමේ ලිපිය (එම ලිපිය  කලත්‍රයා සහ දරුවන් සියළු දෙනාම ප්‍රදේශයේ ග්‍රාම සේවක නිලධාරී ඉදිරිපිටදී අත්සන් කර ග්‍රාම සේවක නිලධාරී විසින් සහතික කළයුතුය)

**විවාහක කොටස් හිමියකු ජීවතුන් අතර නොමැති අවස්ථාවක කොටස් මුදල් ආපසු ලබාගැනීමේ අයදුම්පත්‍රය**

**පළමු කොටස**

**කොටස් හිමි සමාජිකයාගේ විස්තර**

01. කොටස් හිමි සාමාජිකයාගේ නම : ..........................................................................................

02. තේ ශක්ති සාමාජික අංකය : ..........................................................................................

03. ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................................................

04. කොටස් හිමියා සාමාජිකත්වය ලබා සිටි කුඩා තේ වතු සමිතියේ නම : ..........................................

05. කොටස් හිමියා මියගිය දිනය : ...............................

06. කොටස් හිමියා විවාහක /දික්කසාද අයෙක් ද යන්න : ..............................................................

07. කොටස් හිමියාගේ කාලත්‍රයාගේ නම : ...................................................................

08. මියගිය කොටස් හිමියාගේ දරුවන් පිළිබඳ විස්තර

| අනු අංකය | නම | උපන් දිනය | ජීවත්ව සිටීද නැද්ද යන වග | මියගොස් ඇත්නම් මියගිය දිනය | ලිපිනය |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

**09.** කොටස් හිමියාගේ

| මවගේ නම | පියාගේ නම | මව / පියා ජීවතුන් අතර සිටීද | | සහෝදර සහෝදරියන්ගේ විස්තර | |
|---|---|---|---|---|---|
| | | ඇත | නැත | නම | ජීවතුන් අතර සිටී ද / නැද්ද |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

**ඉල්ලීම ඉදිරිපත් කරන අයගේ තොරතුරු**

01. ඉල්ලුම්කරුගේ නම : ..........................................................................................

02. ලිපිනය : ..........................................................................................

03. ජාතික හැඳුනුම්පත් අංකය : ...........................................................

04. දුරකථන අංකය ස්ථාවර : .............................. ජංගම : ..............................

05. නැසීගිය කොටස් හිමි සාමාජිකයාට ඇති ඥාති සම්බන්ධතාවය හා ඉල්ලුම්කරු මියගිය අයගේ නාමිකයාද/උරුමකරු/අද්මිනිස්ත්‍රාත්කරු අන්තිම කැමැත්ත පත්‍රයේ බලකරු ද යන වග } ................................

06. ඉල්ලුම්කරු නැසීගිය සාමාජිකයාගේ ස්වාමිපුරුෂයා හෝ භාර්යාව : ..............................................

නොවන්නේ නම් කලත්‍රයා ජීවත්ව සිටීද ? යන වග ජීවත්ව සිටී නම් : ................................................

කාලත්‍රයාගේ නම හා ලිපිනය : ................................................

07. ප්‍රතිලාභ ඉල්ලුම්කරුගේ මුදල් බැර කළයුතු බැංකු ගිණුම විස්තර

| **බැංකුවේ නම** | **ශාඛාව** | **ගිණුම් අංකය** | **ගිණුම් වර්ගය<br>ඉතිරි කිරීම්/ජංගම** |
|---|---|---|---|
| | | | |

ඉහත දැක්වූ තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් ප්‍රකාශ කරමි. මෙහි අසත්‍ය තොරතුරු පැවසුවහොත් මට විරුද්ධව උසාවියේ නඩු පැවරිය හැකි බව මම දනිමි.

දිනය : ....................................

...........................................

ඉල්ලුම්කරුගේ අත්සන

**ග්‍රාම නිලධාරීගේ / ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය**

.................................................................. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක .................................. දරන ............................................................................. ග්‍රාම නිලධාරී වසමේ ..........................................

(මියගිය අයගේ ලිපිනය)

.......................................................................................................................................................

.......................................................................................................................................................

............................... යන ලිපිනයේ පදිංචිව සිට නැසී ගිය ..........................................................

.......................................................................................................................................................

(මියගිය අයගේ නම)

යන අය සම්බන්ධයෙන් ඉහත පළවන කොටසේ අංක 01 සිට 10 දක්වා හා දෙවන කොටසේ අංක 01 සිට 07 දක්වා සඳහන් කර ඇති සියළු තොරතුරු හා කරුණු සත්‍ය හා නිවැරදි බවත්, අයදුම්කරු / අයදුම්කාරිය මා ඉදිරිපිටදී මාහපට ඇඟිලි සලකුණු හා ඔහුගේ / ඇයගේ සුපුරුදු අත්සන තැබූ බවත් සහතික කොට ප්‍රකාශ කරමි.

............................................

ග්‍රාම නිලධාරියාගේ අත්සන

දිනය :

නිල මුද්‍රාව

................................................

ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන

දිනය :

නිල මුද්‍රාව

(කොටස් වටිනාකම රු. 5000 නොඉක්මවන අයදුම්පත් සඳහා ප්‍රදේශය භාර ග්‍රාම නිලධාරී අත්සන පමණක් ප්‍රමාණවත්ය)

දිවුරුම් ප්‍රකාශය

..........................................................................................................................................................................

(ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම)

.................................................. වන මම බෞද්ධාගමික / ක්‍රිස්තු භක්තිකයෙකු හෙයින් පහත සඳහන් අන්දමට ගෞරව බහුමානයෙන් යුතුව අවංකව ද සත්‍ය ලෙස ද මෙයින් ප්‍රකාශ කොට ප්‍රතිඥා දෙමි / දිවුරුම් දෙමි. (අදාල නැති කොටස් කපා හරින්න)

(1) මෙහි පහත ප්‍රකාශක ඉහත නම සඳහන් මා බවත්.

(2) ....................................................................................පදිංචි ....................................................

(මියගිය සාමාජිකයාගේ සම්පූර්ණ විස්තරය අංක 02 සිට 04 දක්වා)

................................................ නමැති අංය 1975 අංක 35 දරන පනත යටතේ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මඟින් ලියාපදිංචි කරන ලද අංක ...................................................... දරන ...................................................... නම් වූ කුඩා තේ වතු සංවර්ධන සමිතියේ සාමාජිකයෙකු / සාමාජිකාවක වන බව ද තේ ශක්ති සාමාජික අංකය .......................................... බවත්

(3) ඉහත නම සඳහන් .................................................................................... හට 2000 අංක 47 දරන පනත යටතේ තේ ශක්ති අරමුදලේ කොටස් සහතිකපත් අංක ............................................... දරණ කොටස් ............................... වූ සහතිකය හිමිව තිබූ බවත්

(4) එකී .................................................................................... අය ........................................... දින මිය ගිය බවත්

(5) එකී මිය ගිය තැනැත්තාගේ නීත්‍යානුකූල / උරුමක්කරු / පොල්මඃකරු / අද්මිනිස්ත්‍රාත්කරු / බලකරු මම බවත් ප්‍රකාශ කරමි.

(6) ඉහත මියගිය කොටස් හිමිකරුගේ කොටස් හිමිකම ලබාගැනීම සඳහා TSF 01 / TSF 02 (අනවශ්‍ය කොටස් කපා හරින්න) ආකෘති පත්‍රය සමඟ පහත ලේඛන ඉදිරිපත් කරමි.

01.කොටස් හිමිකරුගේ මරණ සහතිකයේ පිටපතක්
02.කොටස් සහතිකයේ මුල් පිටපත
03.සහතික කරන ලද අවසන් කැමති පත්‍රය
04.විවාහක නම් විවාහ සහතිකයේ පිටපතක්
05.දරුවන් සිටීනම් උප්පැන්න සහතික පත්වල පිටපත්
06.ඉල්ලුම්කරුවන්ගේ ජාතික හැඳුණුම්පත්වල සහතික කල පිටපත්

(7) යම් හෙයකින් එම ලියාපදිංචිය සම්බන්ධයෙන් යම් කෙනෙකු විරුද්ධත්වය දැක්වුවහොත් හෝ අභියෝග කළහොත් ඒ සම්බන්ධයෙන් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට හෝ තේ ශක්ති අරමුදලට කිසිදු වගකීමක් ඇති නොවන ආකාරයෙන් අවශ්‍ය සියලු නීති කටයුතු කිරීමේ සම්පූර්ණ වගකීම මම දරන බව ද ප්‍රකාශ කරමි.

ඉහත සඳහන් (අංක 01 සිට 07 දක්වා) දිවුරුම් ප්‍රකාශය, ප්‍රකාශකට කියවා තේරුම්කර දීමෙන් පසු ඔහු විසින් එය නිවැරදි බවට වටහා ගෙන ............................. දින ............................................................ යන ස්ථානයේදී අත්සන් තබන ලදී.

..................................................

ප්‍රකාශකරුගේ අත්සන

(රු. 50/- මුද්දරයක් මත දිවුරුම් කොමසාරිස් හෝ සාම විනිසුරු ඉදිරිපිටදී අත්සන යෙදීම මා ඉදිරිපිටදී)

..................................................

දිවුරුම් කොමසාරිස් / සාම විනිසුරු

......................................................

නිල මුද්‍රාව